# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


2108/25 – 2019 ජනවාරි 29 වැනි අඟහරුවාදා – 2019.01.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇරැව්වල (මහරගම නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/එම්එච්ආර්/2018/28 හා 2018.02.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 01 – ප්‍රමාණය: හෙක්. 0.0100**
උතුරට: කැබලි අංක 3 සහ පාර; නැගෙනහිරට: පී. ඒ. ඩී. සී. ජේ. පෙරියප්පෙරුම සහ තවත් අය හිමිකම් කියන කැකුණගහවත්ත සහ දෙල්ගහවත්ත; දකුණට: පී. ඒ. ඩී. සී. ජේ. පෙරියප්පෙරුම සහ තවත් අය හිමිකම් කියන කැකුණගහවත්ත සහ දෙල්ගහවත්ත, කැබලි අංක 3 සහ 2; බටහිරට: කැබලි අංක 3, 2 සහ පාර.

02. **කැබලි අංක 02 – කැකුණගහවත්ත සහ දෙල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0018**
උතුරට: කැබලි අංක 3 සහ 1; නැගෙනහිරට: කැබලි අංක 1 සහ 3; දකුණට සහ බටහිරට: කැබලි අංක 03.

03. **කැබලි අංක 03 – කැකුණගහවත්ත සහ දෙල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.1821**
උතුරට: ලංකා විදුලිබල මණ්ඩලයට අයත් ඉඩම, සෝමලතා පෙරියප්පෙරුම හිමිකම් කියන කැකුණගහවත්ත සහ දෙල්ගහවත්ත, පාර, කැබලි අංක 1 සහ 2; නැගෙනහිරට: කැබලි අංක 1, 2, පී. ඒ. ඩී. සී. ජේ. පෙරියප්පෙරුම සහ තවත් අය හිමිකම් කියන කැකුණගහවත්ත සහ දෙල්ගහවත්ත, ඇරැව්වල පාරේ වරි. අංක 20/4, 20/4බී දරන ඉඩම්; දකුණට: ඇරැව්වල පාරේ වරි. අංක 20/4, 20/4බී, 20/4ඒ දරන ඉඩම්, ජී. එම්. ටී. බී. ගමගෙදර හිමිකම් කියන කැකුණගහවත්ත සහ දෙල්ගහවත්ත සහ ලංකා විදුලිබල මණ්ඩලයට අයත් භූමිය; බටහිරට: ජී. එම්. ටී. බී. ගමගෙදර හිමිකම් කියන කැකුණගහවත්ත සහ දෙල්ගහවත්ත, ලංකා විදුලිබල මණ්ඩලයට අයත් භූමිය, සෝමලතා පෙරියප්පෙරුම හිමිකම් කියන කැකුණගහවත්ත සහ දෙල්ගහවත්ත සහ පාර.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

යොමු අංකය: 4-3/2/2017/සීර්බී/522.
2019 ජනවාරි මස 02 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 - 464



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*